# අමුතු කුරුල්ලා 2

## බොරු කිච්චට පාඩමක්


## ටී.එච්.ගිනුකි නිසලනී අකිත්‍රා තිරිමාන්න

**කතෘ**


**කතෘගේ වෙනත් කෘති**

**01** අමුතු කුරුල්ලා **(2019)**

**02** බොඳු දැරිවියක් **(2020)**


**ISBN978-624-208-759-7**



මහාමායා බාලිකා විද්‍යාලය

**09** වසර **G**


**2025.02.08**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්තදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනඟන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශෂිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

## **පිදුම**

මා හට අකුරු කිරීමට සැමදා දිරි දුන්
ගුරු මෑණිවරුන්ටත් ගුරු පියවරුන්ටත්
මාගේ ආදරණීය අම්මාටත් හා අප්පච්චිටත්
මේ පොත පුද කරමි........

එකෝමත් එක කාලෙක චූටි දුවෙක් හිටියා. එයාගේ නම ටිකිරි මලී. ටිකිරි මලී හරිම හොඳයි.

හරිම කරුණාවන්තයි.

එයාගේ ගෙදර මිදුලේ ලොකු අඹ ගහක් තිබුණා.

ඒ ගහේ අඹ ගෙඩි හැදෙන කාලෙට ලේන්නු, ගිරව්, මයිනෝ, සැළලිහිණියෝ, කොණ්ඩ කුරුල්ලෝ පිරිලා ඉන්නවා.

ඒත් අඹ ගහේ ගෙඩි නැති කාලෙට මෙයාලා වෙනදා වගේ එන්නේ නෑ. මොකද? එයාලට කෑම නැනේ කන්න.

ටිකිරි මලී කැමති හැමදාම කුරුල්ලෝ ගොඩක් එයාගේ මිදුලට එනවට.

මෙයා මේකට මොකද කරන්නේ ? කියලා එයාගේ අම්මගෙන් ඇහුවා.

අම්මා කිව්වා කුරුල්ලන්ට කෑම දාන්න ලෑල්ලක් හදමු කියලා.

ටිකිරි මලී ඉක්මනට ගිහිං එයාගේ අප්පච්චිට කිව්වා කුරුල්ලන්ට කෑම දාන්න ලෑල්ලක් හදලා දෙන්න කියලා.

ටිකිරි මලී හොඳ වැඩ කරන්න ආස කෙනෙක් කියලා එයාගේ අප්පච්චි දන්නවා.

ඉතිං අප්පච්චි පොරොන්දු උනා නිවාඩු දවසේ කුරුලු ලෑල්ල හදලා දෙන්න.

ඉතිං, සෙනසුරාදා දවසේ උදේම ටිකිරි මලීගේ අප්පච්චි ටිකිරි මලීත් එක්ක කුරුලු ලෑල්ල හැදුවා.

කුරුලු ලෑල්ලට යටින් පින්තාලියක් ගෙනත් තිබ්බා.

ටිකිරි මලීට හරිම සතුටුයි.

එයා කුරුලු ලෑල්ලට කෑම ගෙනත් දැම්මා. පින්තාලිය වතුරෙන් පිරෙව්වා.

ඊට පස්සේ එයා ඈතට වෙලා බලා ගෙන හිටියා මොකද? වෙන්නේ කියලා.

කුරුලු ලෑල්ලෙන් කෑම කන්න පාට පාට කුරුල්ලෝ ආවා.

පොල්කිච්චෝ, දෙමලිච්චෝ, ගේ කුරුල්ලෝ, ගිරව්, මයිනෝ, තව ටිකිරි මලී නම දන්නේ නැති ගොඩක් කුරුල්ලෝ ආවා.

එක දවසක් අමුතු කුරුල්ලෙක් ආවා. ලොකුම ලොකුයි. හරිම ලස්සනයි. එයාගේ පිහාටු අනිත් කුරුල්ලන්ට වඩා දිගයි.

ඔළුවේ ඔටුන්නකුත් දාගෙන හිටියා.

ටිකිරි මලී මේ කුරුල්ලා දිහා ගොඩක් වෙලා බලා ගෙන හිටියා. ඒත් ඇති හිතෙන්නෙ නෑ.

එක පාරටම ඒ කුරුල්ලා ගොරහැඩි නාදයක් නැඟුවා.

ටිකිරි මලී හිතුවා මෙච්චර ලස්සන කුරුල්ලෙක් මෙහෙම කැත විදිහට නාද කරන්නේ ඇයි? කියලා.

එයා එහෙම කල්පනා කර කර හිටියේ නෑ. අම්මා ළඟට දුවලා ගියා. අම්මේ අර කුරුල්ලා කවුද? කියලා අම්මගෙන් ඇහුවා.

අම්මා හිනා වෙලා කිව්වා " **ඒ මොණරෙක්** " කියලා.

ඉතිං, එදා ටිකිරි මලී දැන ගත්තා ඒ අමුතු කුරුල්ලා **මොණරා** කියලා.

ඒත් ටිකිරි මලීට පොඩි ප්‍රශ්නයක්.

මොණරා මෙච්චර ලස්සන කුරුල්ලෙක් වෙලත් මෙයාගේ කට හඬ මෙච්චර කැත වුණේ කොහොමද? කියලා ටිකිරි මලී කල්පනා කළා.

ටිකිරි මලී අම්මාගෙන් ඇහුවා " අම්මේ මේච්චර ලස්සන කුරුල්ලට කැත කට හඬක් හම්බ වුණේ කොහොමඳ කියලා.

මොකද? කුරුල්ලන්ට එක එක පාට හම්බ වුණේ කොහොමද? කියලා දවසක් එයාගේ අම්මා ඒයාට කියලා දීලා තිබුණා.

ටිකිරි මලී අම්මගෙන් එහෙම අහන කොට අම්මට හිනා ගියා.

මොකද දන්නවද? අම්මා දන්නවා ටිකිරි මලී කතන්දරයක් අහගන්න තමයි මේ ලෑස්ති වෙන්නේ කියලා.

ඉතිං, අම්මා ටිකිරි මලීවත් අරගෙන මිදුලේ අඹ ගහ ළඟ තියෙන බංකුවට ගියා.

ටිකිරි මලී බොහොම සතුටින් බංකුවේ ඉඳගෙන අම්මගේ ඔඩොක්කුවේ ඔළුව තියාගෙන ලස්සන කතාන්දරයක් අහගන්න ලෑස්ති වුණා.

ඔන්න ඉතිං අම්මත් ටිකිරි මලීගේ ඔළුව අත ගගා කතන්දරේ කියන්න පටන් ගත්තා.

ඔන්න පුතේ ඉස්සර කාලේ මොණරාට ඔහොම ලස්සන ඇඳුමක් තිබුණෙ නැලු. මොණරා ඇදන් ඉන්නේ අවිච්චියාගේ ඇඳුමලු.

ආ........ ඒ කොහොමද? අම්මේ, ඒ දෙන්නා ඇඳුම් මාරු කර ගත්තේ කියලා ටිකිරි මලී ඇහුවා.

ඉස්සරම කාලේ කැලේ හිටපු කුරුල්ලන්ට එක එක පාට පාට ඇඳුම් තිබුණෙ නෑ. හැමෝටම සමාන්‍ය ඇඳුම් තිබුණෙ.

දවසක් මොණරාට එහා ගමේ මඟුල් ගෙදරක යන්න තිබුණා.

ඒකට ඇඳගෙන යන්නෙ මොකද්ද කියලා කල්පනා කරන කොට එයාට මතක්වුනා අවිච්චියාගේ ඇඳුම අලුත් පාටයි කියලා.

ඒක ඇඳගෙන ගියා නම් හොඳයි කියලා.

එහෙම හිතලා මොණරා නිවාඩු වෙලාවක අවිච්චියාගේ ගෙදරට ගිහිං මඟුල් ගෙදර ඇඳගෙන යන්න එයාගේ ඇඳුම දෙන්න පුළුවන්ද කියලා ඇහුවා.

අවිච්චියා හරිම අහිංසක කුරුල්ලෙක්.

එයා කැමති උනා යාළුවට මඟුල් ගෙදර යන්න එයාගේ ඇඳුම දෙන්න.

ඉතිං, දෙන්නා ඇඳුම් දෙක මාරු කරගත්තා. මොණරා අවිච්චියාගේ ඇඳුම ඇඳ ගෙන, මඟුල් ගෙදර ඉවර වුණ ගමන්ම හෝදලා ගෙනත් දෙන්නම් කියලා පොරොන්දු වෙලා අරගෙන ගියා.

ඔන්න එදා හවස කැලෑවේ හිටිය කුරුල්ලන්ට කැලෑව භාර දෙවියන්ගෙන් සුභ ආරංචියක් ලැබුණා.

මොකද්ද දන්නවද ඒ ආරංචිය?

කැළෑවේ ඉන්න කුරුල්ලන්ට පාට දෙන්න දෙවියෝ තීරණය කරලා. ඒ කියන්නේ තමන් කැමති පාට වලින් හැඩ වෙන්න කුරුල්ලලන්ට දෙවියන්ගේ මාළිගාව ළඟ තියන මාර ගහ යටට එන්න කියලා.

මේක අහපු කුරුල්ලන්ට හරිම සතුටුයි. ඒදා කැළෑවේ හැම කුරුල්ලෙක්ම කතා වුණේ මේ ගැන.

ඉතිං, මේ පණිවිඩය මොණරාටත් හම්බ වුණා. මොණරාට මඟුල් ගෙදර යන්න තියන නිසා එයාට ඕන වුණා එයාගේ ඇඳුම ලස්සනට පාට කර ගන්න.

ඉතිං, ඒයා පණිවිඩය ලැබුණ වේලාවේ ඉඳලා ඇඳුම හැඩ කර ගන්න විදිහ ගැන හිතුවා.

ඉස්සලම පිල් ටිකක් දික්කර ගන්න ඕනි කියලා හිතලා පිල් ටික දික් කර ගෙන ඇඳුමට තියලා අලව ගත්තා.

ඒදා රෑ නිදා ගන්නේවත් නැතුව ඇඟට ඕනි පාටවල් ගැන හිතුවා. ඒයා ඇඳුම ලස්සන කර ගන්න ගොඩක් මහන්සි වුණා.

හැබැයි අව්ච්චියා එහෙම හිතුවේ නෑ. ඒයා හිතුවේ මේ ඇඳුම මගේ නෙමෙයිනේ. ඒක නිසා මම ලස්සන කර ගන්න ඕනි නෑ කියලා.

ඉතිං ඊළඟ දවසේ උදේ පාන්දරම නැඟිටලා , කෑම හොයන්නේවත් නැතුව මොණරා පාට ගන්න දෙවියන් ළඟට ගියා.

හැබැයි එයාට මතක නෑ එයා ඇඳගෙන ඉන්නේ අනුන්ගේ ඇඳුමක් කියලා.

මොණරා උදේම දෙවියන් ළඟට යද්දි වෙන කවුරුත් ඇවිල්ලා නෑ.එයාට හරි සතුටුයි. මොකද? එතකොට කවුරුත් දන්නේ නෑනේ මේ එයාගේ ඇඳුම නෙවෙයි කියලා.

ඉතිං එයා දෙවියන්ගෙන් පාට ඉල්ලුවා.

දෙවියොත් පාන්දරින්ම ආපු කුරුල්ලට ඒයා ඉල්ලන හැම පාටම දෙන්න ලෑස්ති වුණා.

දෙවියෝ මොණරාගෙන් තමන්ට ඕනි මොන පාටද කියලා ඇහුවා. මොණරා දෙවියන්ට කිව්වා එයා ආසම නිල් පාටට කියලා.

හැබැයි එයා ඉන්නේ ගස් උඩ නිසා එයාගේ සතුරන්ට එයාව හොයා ගන්න බැරි වෙන්න ලා කොළ පාටයි නිල් පාටයි මිශ්‍ර වෙලා හැදෙන නිල් පාටට දෙන්න කියලා.

දෙවියෝ නිදහසේ මොණරා කියපු විදිහට නිල් පාටට ලා කොළ පාට ටිකක් මිශ්‍ර කරලා එයාගේ බෙල්ලේ පිහාටුවල ගෑවා.

ඒ පාට හරිම ලස්සන නිල් පාටක්. ඒ නිල් පාටට තමයි පුතේ අපි මොණර නිල (Peacock Blue) කියලා කියන්නේ කියලා අම්මා කිව්වා.

වෙන කුරුල්ලෝ ඇවිල්ලා හිටියෙ නැති නිසා දෙවියොත් මොණරා ඉල්ලන ඉල්ලන පාට දුන්නා.

කළු පාට, තැඹිලි පාට, සුදු පාට,කොළ පාට පිල් වල ගාලා නිදහසේ දෙවියෝ මොණරාව හැඩ කලා.

පාට ගාලා ඉවර උනාම මොණරා හරිම ලස්සනයි. ටික ටික දවල් වෙන කොට අනිත් කුරුල්ලොත් ආවා.

දැන් කාටවත් මෙයාව අඳුරන්න බෑ.

මෙයා  වෙනස් වෙලානේ.

ඉතිං, මොණරාත් මේ ඉන්නේ එයාගෙම ඇඳුම ඇඳගෙන වගේ පේන්න හරිම ආඩම්බරයෙන් හිටියා.

පාට ගන්න අනිත් කුරුල්ලෝ ආපු නිසා මොණරා දෙවියන්ට ස්තූති කරලා හරිම සතුටින් එතනින් ආවා.

දැන් මෙයාට එයාගේ ලස්සන කණ්ණාඩියෙන් බලනකම් ඉවසිල්ලක් නෑ.

කැලෑවේ තියන කණ්ණාඩිය තමයි කැලෑව මැදින් ගලන ගඟ.

මොණරා ඉක්මනට ගිහිං ගඟට එබිලා එයාගේ ලස්සන බැලුවා.

දෙවියනේ මගේ ලස්සන කියලා මොණරා පිල් විදහගෙන ඒ පැත්තට හැරුණා. මේ පැත්තට හැරුණා.

පුදුම ලස්සනක් තියෙන්නනේ.

ඒයාට හිතා ගන්න බෑ මේ ඉන්නේ එයාමද කියලා.

සතුට වැඩිකමට එයා පිල් විදහලා ලස්සන නැටුමකුත් නැටුවා.

හැබැයි මෙයාට දැන් මතක නෑ මෙයා ඇඳ ගෙන ඉන්නේ අවිච්චියාගේ ඇඳුම කියලා.

එයා ඒයාගෙම ඇඳුම ඇඳන් ඉන්නවා කියලා හිතලා තමයි දෙවියන්ගෙන් පාට ඉල්ල ගත්තේ.

අව්ච්චියා ඒදා උදේ ඉදලා කෑම හොය හොයා හිටියා. එතකොට එයා දැක්කා පාට පාට කුරුල්ලෝ ඉන්නවා.

කුරුල්ලෝ තමන් කැමති විදිහට ලස්සන වෙලා ඇවිල්ලා.

ආපහු දවසක කුරුල්ලන්ට පාට හම්බ වෙන්නේ නෑ කියලා අනිත් අය කථා වෙනවා මෙයාට ඇහුණා.

ඒ පාර ඔන්න මෙයත් දෙවියෝ ළඟට ගියා. එතකොට හවස් වෙලා.

ගොඩක් පාට ජාති ඉවර වෙලා.

දෙවියෝ මෙයාගෙනුත් ඇහුවා මොන පාටද ඕනි කියලා.

මෙයා කිව්වා ඔය තියන මොනා හරි පාටක් දෙන්න කියලා.

ඇයි? මෙයා ඇඳගෙන ඉන්නේ එයාගේ ඇඳුම නෙමෙයිනේ.

ඒක නිසා ඒයාට ඕනි නෑ ඒක ලස්සන කර ගන්න.

අනිත් හැමෝම තමන්ට ආස පාටවල් ඉල්ල ගත්තා.

පාට තිබුණ විදිහට දෙවියොත් පාට දුන්නා.

දෙවියන්ටත් පුදුම හිතුණා.

ඒත් අවිච්චියා එහෙම ආස පාටවල් ඉල්ලලා ලස්සන වෙන්න කැමති නැති එකට.

ඉතිං දෙවියොත් ඉතුරු වෙලා තිබ්බ පාට වලින් ටිකක් මෙයාගේ ඇඳුමේ ගෑවා.

ඒයා දෙවියන්ට ස්තූති කරලා ගියා.

හැබැයි මොණරා හිතපු විදිහ වෙනස්.  ඒයා ඇඳගෙන ඉන්න ඇඳුම ලස්සන කර ගන්න මහන්සි ගත්තා.

දැන් මොණරට ඉවසිල්ලක් නෑ මඟුල් ගෙදරට යනකං.

මොකද? අනිත් අයට එයාගේ ලස්සන ඇඳුම පෙන්නන්න.

ඒ අතරේ මොණරා හොරෙන් හොරෙන් අනිත් කුරුල්ලන්ගේ ඇඳුම් දිහා බැලුවා. ඒවා මෙයාගේ එක තරම් ලස්සන නෑ.

ඔන්න මඟුල් ගෙදරට යන දවස උදාවුණා. මොණරා හරිම සතුටින්,  ආඩම්බරයෙන් එහා ගමට යන්න පිටත් වුණා.

මඟුල් ගෙදරට යන අතර මඟ හම්බවෙන හැමෝම සත්තු මෙයා දිහා පුදුම වෙලා බැලුවා.

කැලෑවේ ඉන්න අනික් හැමෝම කුරුල්ලන්ට වඩා මෙයා දැන් ලස්සනයි.

මඟුල් ගෙදරත් හිටපු ලස්සනම කුරුල්ලා මෙයා. හැමෝම මෙයා ළඟට ඇවිත් මෙයාගේ ඇඳුම අතගානවා. ලස්සන බලනවා. පිල් විදහලා පෙන්නන්න කියනවා.

මෙයත් ඉතින් බොහොම සතුටින් එදා දවස ගත කරලා ආපහු මෙයාගේ ගමට ආවා.

එද්දි මෙයා හිත හිත ආවේ මං තමයි දැන් කැලෑවේ ඉන්න ලස්සනම කුරුල්ලා. ඒ කියන්නනේ කුරුල්ලන්ගේ රජ්ජුරුවෝ කියලා.

එහෙම හිතලා මෙයා එන ගමන් පොඩි ඔටුන්නකුත් හදා ගෙන ඔළුවට දාගත්තා.

දැන් මෙයා තවත් ලස්සනයි.

මොණරාව දකින අය ආපහු හැරිලා බලන නිසා මෙයා බොහෝම ආඩම්බරයෙන් ඇවිදිනවා.

ගස්වල උඩටම පියාබනවා. පිල් විදහලා අනික් අයට පේන්න ඉන්නවා.

ඔහොම දවස් දෙක තුනක් ගියාට පස්සේ මෙයාව හොයා ගෙන ඇඳුමේ ඇත්ත අයිතිකාරයා ආවා.

ඒ කියන්නේ අවිච්චියා.

මඟුල් ගෙදර ගිහිං ආපු ගමන් ඇඳුම සෝදලා ගෙනත් දෙනවා කියපු මොණරා මඟුල් ගෙදර ඉවර වෙලත් දවස් ගාණක්

ගිහිනුත් ඇඳුම ගෙනත් දිපු නැති නිසා අව්ච්චියම මොණරාගේ ගෙදරට ආවා.

අව්ච්චියාගේ කට හඬ හරිම තියුණුයි.

ඉතිං, එයා මොණරාගේ ගෙදර ළඟට එන්න කලින් එයාගේ කට හඬ මොණරට ඇහුණා.

එතකොට තමයි එයාට මතක්වුණේ ඇඳුම ආපහු දෙන්න ඕනී කියලා.

මොණරට දැන් මේ ඇඳුම ආපහු දෙන්න බෑ. හැමෝම හිතා ගෙන ඉන්නේ මේක මොණරාගේ ඇඳුම කියලානෙ.

මොකද? මොණරා කාටවත් කිව්වේ නෑ මේ ඇඳුම අව්ච්චියාගෙන් ඉල්ලගෙන ඇඳගෙන ආවේ කියලා.

මඟුල් ගෙදර ගිහිං ආඩම්බරයෙන් හිටපු නිසා දැන් මේ ඇඳුම නැතුව මොණරාට එළියට යන්නත් බෑ.

මොණරා මහන්සි වෙලා උදේම ගිහිං දෙවියන්ගෙන් පාට ඉල්ල ගෙන අව්ච්චියගේ ඇඳුම හැඩ කර ගත්තට අව්ච්චියා පරක්කු වෙලා ගිහිං ඉතිරි වෙලා තිබ්බ පාට පොඩ්ඩක් තමයි මොණරාගේ ඇඳුමේ ගාගෙන තියෙන්නේ.

ඒ ඇඳුම එච්චර ලස්සනත් නෑ. මේ ඇඳුම දෙන්නත් බෑ ලෝභයි.

මොණරා අවිච්චියා ගෙදරට එන්න කලින් හැංගුණා. අවිච්චියා මොණරට කතා කරලා පේන්න හිටියේ නැති නිසා ආපහු ගියා.

මේ විදිහට දින ගණනාවක්ම අවිච්චියා මොණරගේ ගෙදර ගියත් ඒයාට ආපහු ඒයාගේ ඇඳුම ගන්න බැරිවුණා. මොණරා හැංගෙනවා.

අවිච්චියා ඉවසලා ඉවසලා බැරිම තැන මේ නඩුව දෙවියන්ට ගිහිං කිව්වා.

එතකොට දෙවියන්ට මතක් වුණා ඒයා පාට දීපු දවසේ මොණරා පාන්දරින්ම ඇවිත් ලස්සනට ඇඳුම පාට කර ගෙන ගියා කියලා.

දෙවියෝ මේ නඩුව විසදන්න දිනයක් දීලා එදාට දෙන්නටම එන්න කිව්වා.

මේ නඩුව ගැන කැළේ පුරාම පැතිරිලා ගියා. මොණරා ආඩම්බරයෙන් ඇඳ ගෙන ඇවිදින්නේ අනුන්ගේ ඇඳුමක් ද කියලා දැන ගන්න හැමෝටම ඕන වුණා.

සමහරු හිතුවේ මොණරාගේ ඇඳුම ලස්සන නිසා අවිච්චියා බොරු කියලා ඒක ගන්න හදනවා කියලා.

ඒක නිසා ඒදා කැළේ හැමෝම නඩුව අහන තැනට ඇවිත් හිටියා.

දෙවියන්ටත් පුදුම හිතුණා. ඒදා ඇවිත් හිටපු සෙනඟ දැකලා. දෙවියෝ එන්න කිව්වම මඟ අරින්න බැරි හින්දා මොණරා බොහොම දුකෙන් නඩු දිනය දවසේ දෙවියෝ ළඟට ගියා.

අවිච්චියත් ඇවිත් හිටියා.

මොණරා හොරෙන් අවිච්චියා දිහා බැලුවා. ඒ ඇඳුම කැතයි. මෙච්චර ලස්සන ඇඳුමක් දීලා අවිච්චියා ලස්සනට පාට කර ගත්තේ නැති එයාගේ ඇඳුම ආපහු ඇඳගන්න හිත හදාගන්න මොණරාට බැරි වුණා.

ඉතිං මෙයා හිතා ගත්තා මේ ඇඳුම කොහොම හරි අවිච්චියාට නොදී ඉන්නවා කියලා.

දෙවියෝ දෙන්නගෙන්ම ඇඳුම ගැන විස්තර ඇහුවා. අවිච්චියා අඬ අඬ විස්තරේ කියලා ඒයාගේ ඇඳුම ඉල්ලුවා.

මොණරා මේ ඇඳුම එයාගෙමයි කියලා ඇඬුවා.

දෙවියෝ දන්නවා මොණරා බොරු කියන්නේ කියලා. බොරු කියන අයට අමතක නොවෙන්න හොඳ දඩුවමක් දෙන්න ඕනි කියලා දෙවියෝ හිතුවා.

දෙවියෝ කිව්වා බොරු කියන්න හොඳ නෑ. ඇත්ත කියන්න කියලා. ඒත් මොණරා බොරු කිව්වා.

ඒදා කුරුල්ලන්ට පාට දීපු දවසේ මොණරා මහන්සි වෙලා උදේම ඇවිත් ඇඳුම ලස්සන කර ගත්තා.

අව්ච්චියාටත් තිබුණා උදේම ඇවිත් ඒයා ඇඳගෙන හිටපු ඇඳුම ලස්සන කර ගන්න. ඒත් එයා එහෙම කර ගත්තේ නෑනේ.

දෙන්නටම සාධාරණයක් වෙන්න ඕනි නිසා ඇඳුම් දෙක මාරු කරලා දෙන්නේ නෑ කියලා දෙවියෝ හිතුවා. හැබැයි කවුරුවත් බොරු කියන්න හොඳ නෑ.

ඒකට නම් දඬුවම් දෙන්න ඕනි කියලා හිතුවා.

ඉතිං, අවසන් වතාවටත් දෙවියෝ කිව්වා ඇත්ත කියන්න නැත්තන් බොරු කියන අයට සාදාකාලිකවම දුක් වෙන්න වෙයි කියලා කිව්වා.

ඒත් මොණරාට මේ ඇඳුම ආපහු දෙන්න හිත හදා ගන්න බැරි වුණා.

දෙවියන්ට තරහ ගියා. දෙවියෝ බොරු කියන අයට දඬුවම් දෙන්න තිරණය කළා.

මේ දෙන දඬුවම ගැන ආරංචි වන අයත් කවදාවත් බොරු කියන එකක් නෑ කියලා දෙවියෝ හිතුවා.

බොරු කියන කෙනාගේ කට හඬ කැත වෙන්නයි ඇත්ත කිව්ව කෙනාගේ කටහඬ ලස්සන වෙන්නයි කියලා දෙවියෝ ප්‍රාර්ථනා කළා.

එතකොටම අවිච්චියා "අනේ මට මගේ ඇඳුම ඕනි" කියලා කිව්වා. හැමෝටම පුදුමයි. අවිච්චියාගේ කටහඬ හරිම ලස්සන වෙලා.

හරියට සින්දුවක් අහන් ඉන්නවා වගේ අනිත් අයට ඇහුණා.

ඒ හඬ ඇහුනම මොණරා කලබල වුණා. මොකද? ඒයා දන්නවනේ ඒයා කිව්වේ බොරු කියලා. ඒක නිසා එයාත් පොඩ්ඩක් සද්ද කරලා බැලුවා.

මොණරාගේ කට හඬ අහපු ගමන් ඇඳුමේ නඩුව විසදන හැටි බලන්න ආපු කැලෑවේ අය කලබල වුණා. අත්දෙකෙන්ම කන් වහ ගත්තා.

මොකද? මොණරාගේ දැන් කට හඬ කාටවත් අහගෙන ඉන්න බෑ. එච්චරටම කැත වෙලා.

හැමෝම පුදුම වෙලා මොණරා දිහා බැලුවා. මොණරට දැන් ලැජ්ජයි.

ඔන්න එතකොට කැලේ හැමෝම දැන ගත්තා මොණරා වෙන කෙනෙක්ගේ ඇඳුමක් ඇඳගෙන ඉන්නේ කියලා.

නඩුව අහන්න ඇවිත් හිටපු අය මොණරාට හිනා වෙන්න පටන් ගත්තා.

ඉතිං, තවදුරටත් එතන ඉන්න බැරි නිසා මොණරා දෙවියන්නට වැඳලා බිම බලා ගෙන ලැජ්ජාවෙන් එතනින් පියාඹලා ගියා.

ඔන්න පුතේ මොණරා බොරු කිව්ව නිසා ඒදා ඉඳලා තමයි මොණරාගේ කට හඬ කැත වුණේ කියලා අම්මා කිව්වා.

ඇත්ත කිව්ව නිසා අවිච්චියාගේ කට හඬ ඒදා ඉඳලා ලස්සන වුණා.

කට හඬ කැත නිසා මොණරා පුළුවන් හැම වෙලාවෙම සද්ද නැතුව ඉන්න උත්සාහ කළා.

අවිච්චියාගේ කටහඬ ලස්සන නිසා ඒයාගේ යාළුවෝ හැම වෙලාවෙම ඒයා ළඟට ආවාම සින්දු කියන්න කිව්වා.

කැත ඇඳුමක් ලැබුනත් කටහඬ ලස්සන නිසා අවිච්චියා හරිම සතුටින් සින්දු කිව්වා.

කැළෑවේ සත්තු විතරක් නෙමෙයි පුතේ අපිත් මොණරාගේ කටහඬ අහන්න ආස නෑ.

හැබැයි අවිච්චියාගේ කටහඬ අහන්න ආසයි කියලා අම්මා කතන්දරය ඉවර කළා.

ටිකිරි මලීටත් අම්මා ඇත්ත කිව්වේ කියලා හිතුණා. මොණරා ලස්සන වුණාට එයාගේ කටහඬ අහගෙන ඉන්න ආමාරුයි.

ඒ කතාව ඇහුවට පස්සේ ටිකිරි මලී හිතා ගත්තා එයා නම් කවදාවත් බොරු කියලා කටහඬ කැත කර ගන්නේ නෑ කියලා.

ඒවගේම අනුන්ගේ දෙයක් වුනත් පරිස්සම් කරනවා, හොඳට බලා ගන්නවා කියලා.

මොකද? මොණරා එයා ඇඳගෙන හිටපු ඇඳුම ලස්සන කර ගන්න මහන්සි වුණා වගේ අව්ච්චියත් එයා ඇඳගෙන හිටපු ඇඳුම ලස්සන කර ගන්න මහන්සි ගත්තනම් එයාටත් ලස්සන ඇඳුමක් හම්බ වෙනවනේ.......

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැඟීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියා මූලික පරීක්ෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කළාප, පළාත්, ජාතික හා ජාත්‍යන්තරතලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධකර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුයි.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට  එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය  වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,<br>
සෙනෙවිරත්න මහලේකම්.